**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ප්‍රාථමික අංශය**
**සැකසුම ~ W.D.G.M. ටිකිරි සිරි කුමාරි**
**ගුරු උපදේශක**
**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

## 3 ශ්‍රේණිය

## ගණිතය විෂය සදහා විෂය සමගාමී ක්‍රියාකාරකම්

## ¥ අල්ලන සෙල්ලම කරමු.

- දුවේ, පුතේ ඉස්සෙල්ලාම මෙම සෙල්ලමට කැමති නිවසේ සිටින අයට එන්න කියන්න.
- එහෙම නැත්නම් අයියා,අක්කා,නංගි,මල්ලි, ඉන්නව නම් ඒත් ඇති.
- අපි පළමුවෙන් ම අල්ලන කෙනා සොයා ගන්නයි හදන්නේ.
- ඒ සදහා ගණන් කරන්න ඕනේ. හැබයි ගණන් කරන්නේ දහයෙන් දහය.
- ඒ කිව්වේ 10,20,30,40,50,60,70,80,90,100 කියල. සීයෙන් නතර කරනව. සීය ආපු කෙනා ඉවත් වෙනවා.
- මේ ආකාරයට ගණන් කරමින් අල්ලන කෙනා සොයා ගන්න.
- දැන් අනිත් අය දුවද්දී ඉතුරු වූ කෙනා අනිත් අයව අල්ලන්න ඕනේ.
- මේ සෙල්ලම නිදහස් ඕනෙම වෙලාවක ඔබට කළ හැකියි.